# පළතුරු පැළ සහතික කිරීම


*එස්. ජී . ආර් . ද . සිල්වා*
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක .


**අතීතයේ පටන් ශ්‍රී ලංකාවේ පළතුරු වගාව ව්‍යාප්තව තිබුණු බවට සාධක ඇති අතර . වර්තමානයේ මෙය සුළු පරිමාණ ගෙවතු වගා ලෙස හා මිශ්‍ර වගා ලෙස ව්‍යාප්තව ඇත . මේ පළතුරු වර්ග අතර කෙසෙල්, අඹ . අන්නාසි, පැහිරි කුළයේ භෝග, වැල්දොඩම් . පැපොල්, රඹුටන්, අලිපේර, පේර, දූරියන්, අනෝදා, හා මැංගුස්ටින් ප්‍රධාන තැනක් ගනී.**

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ පළතුරු වගා බිම් ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී . පළතුරු වගා කිරීම සඳහා සුදුසු ඉඩම් රාශියක් විශාල වශයෙන් මහවැලි සංවර්ධන ව්‍යාපෘතියට අයත් ප්‍රදේශවල තිබීමෙන් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ඇති ඉඩකඩ වැඩිවී ඇත. රජයේ ප්‍රතිපත්ති අනුව විදේශ වෙළඳපොල සඳහා පළතුරු නිපදවීම සඳහා දෙනු ලබන විවිධ සහනාධාරත් දේශීය හා විදේශීය වෙළඳපොළේ අවශ්‍යතාව වැඩි වීමත් මෙයට හේතු වී ඇත. මෙසේ පළතුරු වගාව ව්‍යාප්ත වීමේ දී පැල, අවශ්‍යතාව සපුරාලීම සඳහා පළතුරු පැල නිෂ්පාදනය සීඝ්‍රයෙන් වැඩිවන අතර එම නිසාම පළතුරු පැලවල ගුණාත්මය පිළිබඳ සැලකිලිමත් විය යුතුයි . මෙම අදහස මුදුන් පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා බීජ සහතික කිරීමේ සේවය මගින් උද්‍යාන බෝග සහතික කිරීමේ වැඩ පිළිවෙලක් දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

පළතුරු පැල සහතික කිරීම යනු: මිළදී ගන්නා පළතුරු පැලයේ ප්‍රවේනි දර්ශය හා අනෙකුත් ලක්ෂණ පිළිබඳව කරනු ලබන ගුණාත්මක ඇගයීමකි.

පළතුරු පැල නිෂ්පාදනයේ පැවැති පහත සඳහන් අඩු පාඩුකම් නිසා මෙම වැඩ පිළිවෙල කඩිනමින් ආරම්භ කිරීමට සිදු විය.

1. මිළ දී ගන්නා පළතුරු පැලයේ වර්ගය පිළිබඳව සහතිකයක් නොතිබීම.
2. රසය, වර්ණය, ප්‍රමාණය, අස්වැන්න හා හැඩය යන ගුණාත්මක කරුණුවල දුර්වලකම්
3. බොහෝ පැලවල එල හට නොගැනීම.
4. කෘමි හා පළිබෝධ හානි අධික වීම.
5. කූට වෙළඳුන්ගේ වංචනික ක්‍රියා
6. බද්ධ දඬු ලබාගත් මවු ශාඛ පිළිබඳව නිවැරදි තොරතුරු නොමැති වීම.

ඉහත සඳහන් ගැටළු වලට මූල් වූ කරුණු නම් :

1. ශ්‍රී ලංකාවේ තිබෙන දුර්වල පැල තවාන්
   - I. ප්‍රභේදන හරිහැටි නොදැනීම.
   - II. සුදුසු මව් ශාඛ මගින් බද්ධ දඬු ලබා නොගැනීම.
   - III. ග්‍රාහක විචලතාවයන්
   - IV. දුර්වල රෝග හා පළිබෝධ මර්ධනය
   - V. තවාන් පාලනය පිළිබඳ අවබෝධය අඩුවීම.
2. ඒකාකාර එලදාව
3. අපනයන සම්මතයන්ට හා ඉල්ලුමට අනුකූල වර්ග නොමැති වීම.
4. නව පළතුරු වර්ග හඳුන්වා දීම හා ගුණනය කිරීමේ පර්යේෂණ සීමාසහිත වීම.
5. විද්‍යාත්මකූල මව් ශාඛ නොකිරීම යන කරුණු බලපාන ලදි.

මෙම ගැටළු මහහරවා ගැනීමට සහ පළතුරු වගාවේ ව්‍යාප්තිය සලකා ආරම්භ කරන ලද පළතුරු පැල සහතික කිරීමේ ව්‍යාපාරයේ අරමුණු නම්

1. බලාපොරොත්තු වන ප්‍රභේදය ලැබෙන බවට සහතික කිරීම.
2. මනාව වැඩුණු නිරෝගී පැලයන් ලබාදීම.
3. උසස් ආරයේ මව් ගසකින් නිෂ්පාදිත පැල ලබාදීම.
4. කූට ව්‍යාපාරිකයන් සහ තවාන් කරුවන් ගෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.
5. හඳුනාගත් උසස් ආරයේ පළතුරු ප්‍රභේද ආරක්ෂා කිරීම.
6. නුසුදුසු භෝග ප්‍රභේදනයන් ව්‍යාප්ත වීම වලක්වාලීම.

මෙම අරමුණු සාර්ථක කරගැනීමේදී පළතුරු පැලයේ ගුණාත්මක ඇගයීම සඳහා පහත සඳහන් කරුණු වලට අවධානය යොමු කරණු ලැබේ.

1. වර්ගයට ආවේණික ලක්ෂණ
2. ග්‍රාහක සඳහා භාවිතා කරන වර්ගය
3. භාවිතා කරන පොලිතීන් පිළිබඳ විස්තර
4. බද්ධ කළ යුතු උස (අංකුර හා රිකිලි බද්ධය )
5. භාවිතා කරන බඳුන් මිශ්‍රණයේ තත්ත්වය
6. පැලයේ නිරෝගී බව
7. අලෙවි කිරීම සඳහා පැලයේ වර්ධනය

මෙම කරුණු පෙරදැරි කරගෙන කරනු ලබන පළතුරු පැල සහතික කිරීම වූ කලී සංකීර්ණ ක්‍රියාවලියකි මෙම ක්‍රියාවලියේ දී

1. වර්ග හඳුනා ගැනීම
2. ග්‍රාහක සඳහා මවු ගස් තේරීම
3. පැල තවාන් ලියාපදිංචි කිරීම
4. තවාන්වල වගා කරන භෝග ලියාපදිංචි කිරීම
5. ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.
6. පැල ලේබල් කිරීම
   සිදු කෙරේ.

**(1) වර්ග හඳුනා ගැනීම:**

මෙම කාර්ය 1986 දී ආරම්භ කරන ලදි . මේ වන විට අඹ වර්ග 17 , රඹුටන් වර්ග 09, අන්නාසි වර්ග 02 සහ කෙසෙල් වර්ග 25 ක් හඳුනා ගැනීමේ ලක්ෂණ අධ්‍යයනය කර අවසන් කර ඇත. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ එක් එක් භෝග හා ප්‍රභේද වෙන වෙනම පහසුවෙන් ලබා ගැනීමයි.

මෙම හඳුනා ගැනීමේ කටයුතු සඳහා කොළ, දළු, මල්, ගෙඩිවල ලක්ෂණ සලකා බැලේ.

**(2) ග්‍රාහක සඳහා මවු ගස් තේරීම.**

මෙය පළතුරු පැල සහතික කිරීමේ ව්‍යාපාරයේ වැදගත්ම අංශයකි. මෙමගින් නියමිත ප්‍රභේදය පාරිභෝගිකයා අතට පත්කිරීම අපගේ බලාපොරොත්තුවයි. දැනට මේ යටතේ රජයේ ගොවිපල අඹ හා රඹුටන් මවුගස් තේරීමේ කටයුතු අවසන් කර ඇත. මෙසේ තෝරා ගන්නා ලද මවුගස් සිතියම් ගතකර අදාල ගොවිපල වලට බෙදා හැරීමට ද කටයුතු යොදා ඇත.

**(3) පැල තවාන් ලියාපදිංචි කිරීම :**

මේ යටතේ දිවයිනේ ඇති පෞද්ගලික පළතුරු පැල තවාන් සහ පළාත් සභා වලට අයත් ගොවිපලවල් ලියාපදිංචි කිරීම කෙරේ . ඉදිරි වර්ෂය සඳහා පැල තවාන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා මෙම අංශය මගින් සැප්තැම්බර් මාසයේ දී පමණ පළාත් භාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් මගින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ . මෙසේ ලැබෙන්නාවූ සියළුම ඉල්ලුම්පත් මෙම අංශය මගින් පරීක්ෂා කර බලා ලියාපදිංචිය සඳහා සුදුසු තවාන් රු.25000 වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අයකිරීමෙන් පසු ලියාපදිංචි කරනු ලැබේ මෙසේ ලියාපදිංචි කරනු ලබන තවාන් කරුවන්ගේ නාම ලේඛනයක් පැල අලෙවියට සම්බන්ධ සියලුම රාජ්‍ය ආයතනවලට දන්වා යවන අතර, පුවත් පත් මගින් ද ප්‍රසිද්ධ කරනු ලැබේ

**(4) තවාන් වල වගා කරන බෝග ලියාපදිංචි කිරීම.**

මෙසේ දෙපාර්තමේන්තුව තුල ලියාපදිංචි තවාන්වල නිපදවනු ලබන භෝග දිවයින පුරා පිහිටි බීජ සහතික කිරීමේ ප්‍රාදේශීය කාර්යාලවල ක්ෂේත්‍ර නිලධාරීන් විසින් කරනු ලබන අතර මෙසේ ලියාපදිංචි කරන ලද බෝගවල විස්තර දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලට දන්වා යැවීම සිදුකරනු ලැබේ .

**(5) ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම :**

මෙම පරීක්ෂණ කටයුතු සහතික කිරීමේ සේවය ප්‍රාදේශීය කාර්යාල වල ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබන අතර, පරියේෂණ කරන අවස්ථාවේ පැලවල වර්ධනය, පැල බඳුන් කිරීම, බද්ධ කිරීම, ඇසිරීම ආදී කටයුතු සම්බන්ධ උපදෙස් නිකුත් කිරීම සහ නිරීක්ෂණ කටයුතු සටහන් කිරීම සිදු කෙරෙන අතර මෙය මූලික ක්ෂේත්‍ර පරීක්ෂණය හා අවසන් ක්ෂේත්‍ර පරීක්ෂණය යනුවෙන් කොටස් 2 කින් කරනු ලැබේ.

(6) පැල ලේබල් කිරීම :

ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් සුදුසු යයි පිළිගත් පැලවලට පමණක් මෙම ලේබල් යෙදීම කරනු ලැබේ. දැනට කර්තකොලම්බන්, වෙල්ලෙයි කොලොම්බන් හා විලාඩ් යන අඹ වර්ගවලට පමණක් මෙම ලේබල් යෙදීම කරනු ලබන අතර ඉදිරියේ දී ඩම්පර හා පිටර් සසාන යන අඹ වර්ගද මල්වාන, මැලයන් සහ රතු මැලයන් යන රඹුටන් වර්ග හා ලෙමනිත් හා දේශිය දෙහි යන පැහිරි බෝග දක්වා මෙය ව්‍යාප්ත කරනු ලැබේ . මෙසේ යොදනු ලබන එක් ලේබලයක් සඳහා රු : 1 . 10 ක මුදලක් අය කරනු ලැබේ.